# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2283/18 - 2022 ජුනි මස 06 වැනි සඳුදා - 2022.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා. අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/39

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා විසිනි**

මුද්‍රාව

**ගෝඨාභය රාජපක්ෂ**

1. ජනාධිපති නීතිඥ ගරු බුවනෙක පණ්ඩුකාභය අලුවිහාරේ මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
2. සේනාධිපති මුදියන්සේලාගේ වික්‍රමසිංහ මැතිතුමා
   හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති
3. නානායක්කාර අපරක්කගේ සුජීව වසන්ත කුමාර මැතිතුමා
   අතිරේක ප්‍රධාන තක්සේරුකරු

වෙත :

ශුභාශිංසන පූර්වකවයි !

2022 මාර්තු මස 31 දින සිට 2022 මැයි මස 15 දින දක්වා කාල පරිච්ඡේදය තුළ රටේ ප්‍රදේශ කිහිපයක සිදු වූ ගිනි තැබීම් ඇතුළු සියලු ආකාරයේ විනාශකාරී ක්‍රියාවන්, මං කොල්ලකෑම් සහ සොරකම් හේතුවෙන් සිදු වූ ජීවිත අහිමි වීම් සහ පුද්ගලයින්ට තුවාල සිදු වීම්, දේපල අලාභ හානි සහ විනාශවීම් දැඩි සංවේගයෙන් හා කණගාටුවකින් යුතුව සළකනු ලබන හෙයින් ද;

තවද, එවැනි සිද්ධීන්ට මුහුණදුන් පුද්ගලයින්ට සුදුසු සහන සහ/හෝ පිලියම් ලබා දීම සඳහා ඉහත සඳහන් සිද්ධීන් පිළිබඳව තොරතුරු ලබා ගැනීම, විමර්ශනය සහ පරීක්ෂණ කිරීම මහජන ආරක්ෂාව සහ ශුභසිද්ධිය පිණිස ජාතික අවශ්‍යතාවයක් වන බව මා අදහස් කරනු ලබන හෙයින් ද;

තව ද, මෙහි මින්මතු සඳහන් කරනු ලබන කරුණු පිළිබඳව තොරතුරු ලබා ගැනීමට සහ විමර්ශනය සහ පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කිරීම අවශ්‍යයැයි මාහට හැඟී යන හෙයින් ද;


1A - G 36902 — 366 (2022/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තව ද, මෙම අධිකාරී පත්‍රය යටතේ සිදු කරනු ලබන විමර්ශන සහ පරීක්ෂණවලට අමතරව නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සහ / හෝ වෙනත් අදාළ පාර්ශවකරුවන් විසින් ගෙන ඇති හෝ අනාගතයේ දී ගනු ලබන කිසිදු ක්‍රියාමාර්ගයකට සහ අපරාධකරුවන්ට වගවීම් පැවරීමට සහ / හෝ ඉහත කී අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට මේ මගින් අගතියක් නොවන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, සංශෝධිත (393 වන අධිකාරය වන) 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව ඉහත කී,

1. **ජනාධිපති නීතිඥ ගරු බුවනෙක පණ්ඩුකාභය අලුවිහාරේ මැතිතුමා**
   **ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු**
2. **සේනාධිපති මුදියන්සේලාගේ වික්‍රමසිංහ මැතිතුමා**
   **හිටපු ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති**
3. **නානායක්කාර අපරුක්කගේ සුජීව වසන්ත කුමාර මැතිතුමා**
   **අතිරේක ප්‍රධාන තක්සේරුකරු**

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු පිළිබඳව තොරතුරු ලබාගැනීම, විමර්ශනය සහ පරීක්ෂා කර වාර්තා කිරීම සම්බන්ධයෙන් මාගේ කොමසාරිස්වරුන් ලෙස පත් කරමි.

එකී කරුණු කවරේද යත්;

(අ) 2022 මාර්තු 31 වෙනි දින සිට 2022 මැයි 15 වන දින දක්වා කාලපරිච්ඡේදය තුළ දිවයිනේ ප්‍රදේශ කිහිපයක සිදු වූ ගිනි තැබීම් ද ඇතුළු සියළු ආකාරයේ විනාශකාරී ක්‍රියාවන්, මංකොල්ලකෑම් සහ සොරකම් හේතුවෙන් තම දේපල සහ ජීවිතවලට හානි වූ හෝ බලපෑම් සිදු වූ පුද්ගලයින්, ආයතන, සංවිධාන සහ සංගම් වෙතින් ඉදිරිපත් වී ඇති හිමිකම් ඉල්ලීම්;

(ආ) එකී කාල පරිච්ඡේදය තුළ සිදු වූ ගිනි තැබීම් ද ඇතුළු සියලු ආකාරයේ විනාශකාරී ක්‍රියාවන්, මංකොල්ලකෑම් සහ සොරකම්වලට ගොදුරු වූ වින්දිතයින් සහ චංචල හෝ නිශ්චල දේපල වර්ග හඳුනාගැනීම සහ වර්ගීකරණය කිරීම;

(ඇ) එකී සිද්ධීන්ට ගොදුරු වූ වින්දිතයින්ට සිදු වූ අලාභය සහ හානිය තක්සේරු කිරීම සඳහා මාර්ගෝපදේශ සහ / හෝ නිර්ණායක සකස් කිරීම සහ ඉහත සඳහන් ඕනෑම ක්‍රියාවකට ලක්වී දේපල සහ ජීවිත හානිවලට ගොදුරුවූ එක් එක් පුද්ගලයින්ට සිදු වූ අලාභ හානිවල පාඩුව ප්‍රමාණීකරණය කිරීම;

(ඉ) එකී අලාභ සහ / හෝ හානි, විධායක හෝ පරිපාලන තීරණවලට අනුව හෝ ජනරජයේ ලිඛිත තීරණවලට අනුකූලව, රක්ෂණ ඔප්පු, ආයතනික අරමුදල් වැනි වෙනත් විකල්ප ක්‍රමයක් මගින් ආවරණය වේ ද හෝ හානිපූරණය කළ හැකි ද යන්න පිළිබඳව තක්සේරු කිරීම;

(ඊ) මෙම හිමිකම් ඉල්ලීම් සඳහා වන්දි ගෙවීමේ හැකියාව, වන්දි ගෙවීමේ උපරිම සීමාව, අලාභ සහ / හෝ හානි පිළිබඳව සාර්ථකව තීරණය වූ අවස්ථාවක වින්දිතයින්ට පිරිනැමිය යුතු වන්දි ප්‍රමාණය තක්සේරු කිරීම සහ සුදුසු පුද්ගලයින්ට වන්දි ගෙවීමේ ක්‍රියාවලිය තීරණය කිරීම;

තව ද, පූර්වෝක්ත කොමිෂන් සභාවේ **සභාපතිවරයා** වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, **ජනාධිපති නීතිඥ ගරු බුවනෙක පණ්ඩුකාභය අලුවිහාරේ** වන ඔබ මම මෙයින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳ ව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබහට මෙයින් බලය හා අධිකාරිය පවරන අතර ම, මෙම බලය ලබා දීමෙන් **මාස තුනක් (03)** ඇතුළත ඔබගේ පරීක්ෂණ සහ විමර්ශනවල සොයාගැනීම් සහ ඊට අදාළ ඔබගේ නිර්දේශ ඇතුළත් වාර්තාවක් මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තව ද, පූර්වෝක්ත කරුණුවලට අදාළ වන යම් පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබගේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තව ද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලු සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලු තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි .

තව ද, ඉහත කී පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වෙනි වගන්තියේ ප්‍රතිපාදන මෙම කොමිසම සඳහා ද යොදා ගත යුතු බවට මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසි දෙකක් වූ මැයි මස 31 දින, කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**ගාමිණී සෙනරත්,**
ජනාධිපති ලේකම්.

EOG 06 - 0073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.